# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1769/6 – 2012 ජූලි 31 වැනි අඟහරුවාදා – 2012.07.31**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී.– 80/34.

### පඩිපාලක සහා ආඥාපනත

නිවේදනයයි

පඩිපාලක සහා ආඥාපනතේ (136 පරිච්ඡේදයේ) 20(2)ඩී යන වගන්තිය යටතේ, ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් මස 03 වැනි දින අංක 9327, වර්ෂ 1949 අප්‍රේල් මස 01 වැනි දින අංක 9963, වර්ෂ 1953 ජූනි මස 25 වැනි දින අංක 10541, වර්ෂ 1958 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 11568, වර්ෂ 1962 ජූනි මස 22 වැනි දින අංක 13179 යන ගැසට් පත්‍රයන්හි පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධාරියා ලෙස පත් කරනු ලැබූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තැන්පත්, දිමිංගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න වන මම, මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයන්හි නියුක්ත සේවකයන් කෙරෙහි වර්ෂ 2012 ජූලි මාසය තුළ අදාළ කළ හැකි ජීවන වියදම් දර්ශකාංකය (2006/07 පදනම් වූ) 166.7 වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

**ඩී. බී. පී. සුරංජනා විද්‍යාරත්න,**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 563,
කොළඹ.
2012 ජූලි මස 31 වැනි දින,

උපලේඛනය

1. කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සැදීමේ ව්‍යාපාරය.

09 – 567/1

## කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සෑදීම යන කර්මාන්තවල නියුතු සේවකයන්ට ගෙවිය යුතු විශේෂ දීමනා

ඉහත සඳහන් කර්මාන්තය සඳහා 2012 ජූලි මාසයේ ජීවන වියදම් අංකය 166.7 වන නිසා 2012 අගෝස්තු මාසයේ සාමාන්‍ය වැඩකරන දිනයක් වෙනුවෙන් ගෙවිය යුතු විශේෂ දීමනා පහත දැක්වෙන ආකාරයට බැව් පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීම හා සෑදීම යන කර්මාන්තයන්**

| *සේවා පන්තිය* | *සාමාන්‍ය වැඩකරන දිනකට ලැබිය යුතු විශේෂ දීමනා* |
|---|---|
| | *රු. ශ.* |
| *දෛනික වැටුප් ලබන්නෝ –* | |
| කම්කරුවෙකුට - පිරිමි/ගැහැණු | 503 . 25 |

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 ජූලි මස 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

09 – 567/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.